සුවෙන් පෙරට

**e ඉගෙනුම් පියස**

**මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය**

ZEOM
කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ
மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட
Zonal Education Office - Minuwangoda

වාරය - II

| ශ්‍රේණිය : 10 | විෂයය : ගෘහ ආර්ථික විද්‍යාව | පාඩම : නිපුණතාවය 2 - ගෘහිය සම්පත් ඵලදායී ලෙස උපයෝගී කර ගනියි. |
|---|---|---|

නිපුණතා මට්ටම - 2.1 ගෘහිය කාර්යයන්හිදී භාවිතා වන විවිධ සම්පත් හඳුනා ගනියි.

## ගෘහිය සම්පත්

නිවසේ සාමාජිකයින්ගේ පෞද්ගලික අවශ්‍යතා මෙන්ම සියළුම ගෘහ කාර්යයන් සාර්ථකව ඉටු කර ගැනීමට අවශය වන්නේ විවිධ සම්පත්ය.

පවුලේ අවශ්‍යතා අනුව විවිධ කාර්යයන් ඉටුකල යුතුය. ඒ අනුව කාර්යයන් ඵලදායී ලෙස ඉටු කර ගැනීම සඳහා උපයෝගී වන දෑ ගෘහීය සම්පත් ලෙස හැඳින්වේ.





ගෘහිය සම්පත් ප්‍රධාන වර්ග 02 කි.

1. මානව සම්පත්
2. මානව නොවන සම්පත්

## ගෘහීය සම්පත් වර්ගීකරණය

- ගෘහීය සම්පත්
  - මානව සම්පත්
    - ආකල්ප
    - කුසලතා
    - ශ්‍රමය
  - මානව නොවන සම්පත්
    - භෞතික සම්පත්
    - භෞතික නොවන සම්පත්
      - කාලය
      - විදුලිය
      - මුදල්
      - ජලය
      - ඉන්ධන
      - ඉඩකඩ
      - ප්‍රජා පහසුකම්
      - දේපල

## ඇගයීම් අංක - 1

පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. මානව සම්පත් වර්ග කර එකිනෙක කෙටි හැඳින්වීමක් කරන්න.

2. පහත කාර්යයන් සඳහා අවශ්‍ය ගෘහීය සම්පත් ලියන්න.

- ආහාර පිසීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය තෝරා ගැනීම.
- රෙදි සේදීම.
- නිවසේ මකුළුදැල් කඩා පිරිසිදු කිරීම.
- ඉවත දමන ද්‍රව්‍ය වලින් මුළුතැන්ගෙය සඳහා අවශ්‍ය බිත්ති සැරසිල්ලක් සෑදීම.
- අම්මා දියණියට ඇඳුමක් මැසීම.

3. නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. භෞතික නොවන සම්පත් භාණ්ඩය වනුයේ,

   i. මුදල් , ඉන්ධන  ii. ජලය , ඉඩකඩ  iii. කාලය , විදුලිය

2. මුදල් , ඉඩකඩ යනු,

   i. භෞතික සම්පතකි  ii. භෞතික නොවන සම්පතකි  iii. මානව සම්පතකි

3. විවිධ කාර්යයන්හි නිරත වීම සඳහා පුද්ගලයෙකු සතු හැකියාව වනුයේ,

   i. ආකල්ප  ii. කුසලතා  iii. ශ්‍රමය

4. වැටුප් බැංකු වලින් ලැබෙන පොලී කොටස් මිලදී ගැනීමෙන් ලැබෙන ලාභාංශ අයත් වන ගෘහීය සම්පත වනුයේ,

   i. දැනුම  ii. මුදල්  iii. ඉන්ධන

5. ප්‍රජා පහසුකමක් නොවනුයේ ,

   i. ක්‍රීඩා පිට්ටනි  ii. බැංකු  iii. රජයේ අධ්‍යාපනික ආයතන

පෙළ පොතේ 28 - 32 දක්වා පිටු අංක කියවා ඉහත කාර්යය පත්‍රිකාව සම්පූර්ණ කරන්න.

සුවෙන් පෙරට

**e ඉගෙනුම් පියස**

**මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය**

කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ
மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட
Zonal Education Office - Minuwangoda

වාරය - II

| ශ්‍රේණිය : 10 | විෂයය : ගෘහ ආර්ථික විද්‍යාව | පාඩම : නිපුණතාව 2 - ගෘහීය සම්පත ඵලදායී ලෙස උපයෝගී කර ගනියි |
|---|---|---|

නිපුණතා මට්ටම - 2.2. ගෘහීය සම්පත් ඵලදායී ලෙස උපයෝගී කර ගත හැකි ආකාරය විමර්ශනය කරයි.

## ගෘහීය සම්පත්

සෑම පුද්ලයෙකුගේම අවශ්‍යතා හා අපේක්ෂා අසීමිත වුවද ඒවා ඉටු කර ගැනීම සඳහා ඇති සම්පත් සීමිතය. සීමිත සම්පත් වලින් උපරිම ඵල ලබා ගැනීමට උත්සහා කල යුතුය.

පහත උදාහරණය මගින් එය පැහැදිලි වනු ඇත .

- ✓ කාර්යය බහුල උදෑසනක නිවසේ කටයුතු ඉටු කර ගන්නා අයුරු
- ✓ මව පියා සහ අවුරුදු 14 ක දියණියද අවුරුදු 12 ක පුතණුවන්ද වාසය කරති. මව පියා දෙදෙනාම රැකියාවට යන අතර මිත්තණිය දරුවන්ගේ ආරක්ෂාවට ගෙදර වාසය කරයි.

පවුලේ සාමාජිකයින්ගේ කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

| පවුලේ සාමාජිකයින් | පැවරී ඇති කාර්යයන් |
|---|---|
| අම්මා | උදය ආහාර වේල සැකසීම. මෙහිදී ගෙවත්තේ එළවළුද භාවිතා කර ඇත . |
| තාත්තා | තේ සාදා දීම.<br>පාසලට යාමට පුතාව සූදානම් කිරීම.<br>නිවස පිරිසිදු කිරීම.<br>පෙර දින රාත්‍රියේ සියළුම ඇඳුම් මැද තැබීම. |
| දියණිය | අම්මාට සහය වීම.<br>මල්ලීට කෑම සූදානම් කිරීම.<br>කුඩා මුළුතැන්ගෙය පිරිසිදු කිරීමට තාත්තාට සහාය වීම. |
| මිත්තණිය | ආගම සිහි කිරීමට සහාය වීම<br>දරුවන් පාසල් යාමට සූදනාම් වීමේදී සහාය වීම. |
| | |

ඉහත කාර්යයේදී කාලය පිරිමැසීම, ශ්‍රම විබජනය මගින් ශ්‍රමය කලමණාකරණය සිදු වීම. තිබෙන මුදල් ප්‍රමාණය අරපිරිමැස්මෙන් භාවිතා කිරීම. ඉඩකඩ හා විදුලිය ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීම යන කරුණු නිසා සීමිත සම්පත් වලින් කාර්යය සාර්ථකව ඉටු කර ගැනීමට හැකි වී ඇත.

වාරය - II

## ඇගයීම් අංක - 1

1. නිවසට පැමිණි අමුත්තන් දෙදෙනෙකුට රාත්‍රී ආහාරය සැකසීම.

   ඉහත කාර්යය සාර්ථකව ඉටුකර ගැනීමට සීමිත ගෘහීය සම්පත් උපයෝගී වූ ආකාරය පිළිබඳ වාර්තාවක් සකස් කරන්න.
2. අභ්‍යාසය 2.1,2.2 ට පිළිතුරු ලියන්න.
3. පෙළ පොතේ පිටු අංක 32 - 33 දක්වා අධ්‍යයනය කරන්න. තව දුරටත් පිළිතුරු සපයන්න.